# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 64 දරන සමාජ සහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 නොවැම්බර් මස 12 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 නොවැම්බර් මස 13 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

**2009 අංක 64 දරන සමාජ සහන පදනම**
**(සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2009 නොවැම්බර් මස 12 වන දින]

එල්.ඩී.—ඕ.(අයි එන් සී 24/2008)

**සමාජ සහන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"සමාජ සහන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වී ඇති රීතිවලට අනුකූලව එකී පදනම සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එකී පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් ද, ඒ පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

**1.** මේ පනත 2009 අංක 64 දරන සමාජ සහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සමාජ සහන පදනම සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) සමාජ සහන පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සමාජ සහන පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද, එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) අඩු වරප්‍රසාදලාභී පුද්ගලයන්ට, පවුල්වලට හා ජන කොටස්වලට ආධාර කිරීම;

(ආ) රැකියා අහිමි වීම, රෝගී වීම, අබල දුබලතාවයට පත් වීම, මරණය හෝ වෙනත් හේතු නිසා අසරණ වූ කම්කරුවන්ගේ හා ගොවීන්ගේ පවුල්වලට ආධාර කිරීම;

(ඇ) ස්වේච්ඡාවෙන් සේවයෙන් ඉවත් වූ, විශ්‍රාම ගියා වූ හෝ විදේශ රැකියාවලින් ආපසු පැමිණි කම්කරුවන්ට තම ඉතිරි කිරීම් පාලනය කර ගැනීම හෝ කුඩා පරිමාණයේ ව්‍යාපාර පටන්ගැනීම පිළිබඳව උපදෙස් දීම හා ආධාර කිරීම;

(ඈ) විදේශ රැකියාවල නියුතු කම්කරුවන්ගේ පවුල්වලට ඔවුන්ගේ සුභ සිද්ධිය සඳහා උපදේශන සේවා සැපයීම හා ආධාර කිරීම;

(ඉ) ව්‍යාපාර වැසීම, සේවකයන් අඩු කිරීම, සේවකයන් අධික වීම හෝ වෙනත් හේතු නිසා රැකියා අහිමි වූ කම්කරුවන්ට ස්වයං සහ වෙනත් රැකියාවල යෙදීම සඳහා ආධාර කිරීම;

(ඊ) රැකියාවේ සහ ඒ හා අදාළ ප්‍රශ්න විසඳා ගැනීමට හා අයිතිවාසිකම් සහ ගෘහස්ථ පරිසරය පිළිබඳව කම්කරුවන්ට හා පවුල්වලට උපදේශන සේවා සැපයීම හා ආධාර කිරීම;

(උ) මානසික දුබලතාවයන්ගෙන් යුත් පුද්ගලයන්ට උපදේශන සේවාවන් පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඌ) අඩු වරප්‍රසාදලාභී තරුණ තරුණියන්ට ස්වයං රැකියාවල යෙදීමට හෝ වෙනත් රැකියා ලබා ගැනීම සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම හෝ වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ සහාය වීම;

(එ) අඩු වරප්‍රසාදලාභී පවුල්වලට නිවාස ලබාදීම හෝ නිවාස ලබා දීමට සහාය වීම හෝ නිවාස වැඩිදියුණු කර ගැනීම සඳහා සහාය වීම;

(ඒ) අඩු වරප්‍රසාදලාභී කාන්තාවන්ගේ හා ළමයින්ගේ පෝෂණ තත්ත්වය පිළිබඳ විශේෂ අවධානයකින් යුතුව මහජන සෞඛ්‍ය දියුණු කිරීම;

(ඔ) දුම්පානයෙන්, මත්පැන්වලින්, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමෙන් වැළැක්වීම සහ ඉහත කී දේවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම;

(ඕ) පරිසරය ආරක්ෂා කිරීම සහ වැඩි දියුණු කිරීම.

(2) (1) වන උපවගන්තියේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී, එම ක්‍රියාත්මක කිරීම, ජාතිය, කුලය, ආගම, භාෂාව, ස්ත්‍රී පුරුෂභාවය හෝ දේශපාලන මතය මත වන වෙනස්කමකින් තොරව ක්‍රියාත්මක කරනු ලබන බවට සංස්ථාව වගබලා ගත යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන දෑ කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය:—

(අ) 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් නීයාදනය කිරීම;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට කෙළින්ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ නියෝජිතයකු මාර්ගයෙන් ඇතුළු වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ඇ) මුදලින් හෝ ද්‍රව්‍යවලින්, ත්‍යාග, පරිත්‍යාග හෝ රික්තවරණ භාර ගැනීම;

(ඈ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන මුදල් සුදුසු යයි සංස්ථාව විසින් සලකනු ලබන ආකාරයකට සහ එසේ සුදුසු යයි සලකනු ලබන ඇප මත මුදල් අත්තිකාරම් දීම හෝ ණයට දීම හෝ ණයට ගැනීම;

(ඉ) සංස්ථාවේ අරමුණු සඳහා වහා අවශ්‍ය නොවන අරමුදල් කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකට ආයෝජනය කිරීම සහ බැංකුවල ජංගම තැන්පතු හෝ ඉතිරි කිරීමේ ගිණුම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම හෝ වසා දැමීම;

(ඊ) පොත්, වාර ප්‍රකාශන, සඟරා සහ වෙනත් ලිපි ලේඛන පළ කිරීම හෝ පළ කිරීමට සැලැස්වීම සහ පුස්තකාල, පිහිටුවීම සහ පවත්වාගෙන යාම; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වාගෙන යාම, ඔවුන්ගේ සේවා නියම සහ කොන්දේසි නියම කිරීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ සභාපතිවරයා, උප සභාපතිවරයා, ලේකම්වරයා, උප ලේකම්වරයා, භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන තවත් සාමාජිකයන් නව දෙනකුගෙන් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් මේ පනතේ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ රීති යටතේ අලුත් කළමනාකරණ මණ්ඩලයක් පත්කරනු ලබන තෙක් සංස්ථාවේ ප්‍රථම මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලුම කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස් වීම හෝ ඔවුන් නෙරපීම;

(ආ) කළමනාකරණ මණ්ඩලයේ නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් ධුරය හිස් කිරීම, ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්යය;

(ඇ) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, එහි බලතල, චර්යාව සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය සහ මණ්ඩලයේ සාමාජිකයන්ගේ පුරප්පාඩු පිරවීම;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය;

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන හා රැස්වීම්වල ගණපූර්ණය සහ එම රැස්වීම්වල දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සහ එහි අරමුදල්වල භාරකාරත්වය; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කරගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

7. සභාපතිවරයා ද ලේකම්වරයා හෝ භාණ්ඩාගාරික යන දෙදෙනාගෙන් එක් අයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අය විය යුතු සියලුම ණය හා පදනම වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

9. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාර ගන්නා ලද හෝ මින් මතු භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේදී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විගණනය හා ගිණුම්.

10. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුනහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදාදෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.